කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
<u>කෘෂිකර්ම අංශය</u>

2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2027 වර්ෂය සඳහා **කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග** අමාත්‍යාංශයේ **කෘෂිකර්ම අංශය** වෙත වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ භාණ්ඩ, වැඩ හා සේවා සැපයීම් වෙනුවෙන් සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා **ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය** විසින් සුදුසුකම්ලත් දේශීය නිෂ්පාදකයන්, දේශීය සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන්, ප්‍රජාපාදක සංවිධාන හා විදේශීය සැපයුම්කරුවන්ගේ බලයලත් නියෝජිතවරුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

අදාළ අයදුම්පත්‍රය බාගත කිරීම සහ අනෙකුත් සියලු විස්තර 2026.11.10 දින සිට 2026.12.01 දින දක්වා **කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග** අමාත්‍යාංශයේ **කෘෂිකර්ම අංශයේ** නිල වෙබ් අඩවිය වන **www.agrimin.gov.lk වෙත පිවිස ලබා ගත හැකි ය. (වෙබ් අඩවියේ මුල් පිටුවෙහි "2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම" සබැඳිය** වෙත ගොස් **අදාළ තොරතුරු පත්‍රිකාව** බාගත කර ගත හැකි ය.)

සියලුම සැපයුම්කරුවන් (පෙර වර්ෂවල ලියාපදිංචි වූ සැපයුම්කරුවන් ද ඇතුලුව) 2027 වර්ෂය සඳහා ලියාපදිංචි විය යුතු අතර නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර අදාළ ලිපි ලේඛන සහ මුදල් ගෙවන ලද රිසිට් පත් ද සමඟ 2026.12.01 වන දින හෝ එදිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන හා ප්‍රසම්පාදන), කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය, පළමු මහල, 80/5, "ගොවිජන මන්දිරය", රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ අතින් ගෙනැවිත් භාර දීම කළ යුතු යි.
දුරකථන අංක: 0112 – 034345 මඟින් වැඩිදුර විස්තර ලබා ගත හැක.

ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
නො. 80/5, "ගොවිජන මන්දිරය", රජමල්වත්ත පාර, බත්තරමුල්ල.